# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1652/5 - 2010 මැයි 03 වැනි සඳුදා - 2010.05.03**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 16/2008.

**2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 42 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවෙහි නිශ්චිතව සඳහන් කොට ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකු මගින් දැනට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු එම උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් කර ඇති අත්කර ගැනීමේ බැංකුව වෙත මේ නියෝගය මගින් පවරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2010 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
| --- | --- |
| (1) 1998 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 1049/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ රජරට සංවර්ධන බැංකුව.<br><br>(2) 1998 නොවැම්බර් මස 11 වැනි දින අංක 1053/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ ඌව සංවර්ධන බැංකුව.<br><br>(3) 1998 නොවැම්බර් මස 11 වැනි දින අංක 1053/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ සබරගමුව සංවර්ධන බැංකුව. | 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව. |

1A - G 012786—335 (2010/05)

*උපලේඛනය සම්බන්ධිතයි*

| ***I*** *වැනි තීරුව* | ***II*** *වැනි තීරුව* |
|---|---|
| (4) 1998 නොවැම්බර් මස 11 වැනි දින අංක 1053/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ වයඹ සංවර්ධන බැංකුව.<br><br>(5) 1998 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 1049/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව.<br><br>(6) 1998 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 1049/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ කඳුරට සංවර්ධන බැංකුව. | |

05-368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.